


සභාපති තෝමස් එස්.
මොන්සන් විසිනි

# මෝර්මොන්ගේ පොතෙහි අනර්ඝ පොරොන්දු

බොහෝ වසර ගණනාවකට පෙර තරුණ මනුෂ්‍යයෙකු ජීවිතය සහ මරණය අතර සිටියදී ඔහුගේ යහනාව අසල මම සිටගෙන සිටියෙමි ඔහුගේ දුක්බර භාර්යාව සහ ඔවුන්ගේ දරුවන් දෙදෙනා අසල රැඳී සිටියහ ඔහු මාගේ අත ඔහුගේ අතින්ගෙන, බැගෑපත් ලෙසින් බලා මෙසේ කීවේය. "සභාපතිතුමෙනි, මම මරණයට පත්වන්නට යන බව මම දනිමි. එය එසේ සිදුවන විට මාගේ ආත්මයට වන්නේ කුමක්දයි පවසන්න."

මම ස්වර්ගීක මඟපෙන්වීම උදෙසා නිහඬ යාච්ඤාවක් ඔප්පුකළ විට ඔහුගේ යහනාව අසල මේසය උඩ ත්‍රිත්ව එකතුවේ පිටපතක් දුටිමි. මම පොත අතින් ගෙන පිටු පෙරලව්මි. ක්ෂණයකින් මාගේ උත්සාහයෙන් තොරව සොයා ගැනුනේ, මෝර්මොන්ගේ පොතෙහි ඇල්මා 40 වන පරිච්ඡේදය නැවතිනි. මම ඔහුට මෙම වචන කියවුවෙමි:

"බලන්න, එය දේවදූතයෙකුගේ මාර්ගයෙන් මා හට දන්වන ලද්දේය එනම් සියළු මනුෂ්‍යාන්ගේ ආත්ම, මෙම මැරෙන සුළු ශරීරයෙන් එය පිටත්වූවහාම . . . ඔවුනට ජීවිතය දුන්නාවූ දෙවියන්වහන්සේගේ නිවෙසට රැගෙන යන්නේය.

"තවද . . . ධර්මිෂ්ඨ අයවලුන්ගේ ආත්මයන්, එය පරාදීසීයයි හඳුන්වන්නාවූ විශ්‍රාමීක තත්වයකට, සමාදානයේ තත්වයකට, කුමක්ද සියළු කරදර සහ වේදනාවේන් විශ්‍රාමය ඔවුහු ලබාගන්නෝය." (ඇල්මා 40:11-12)

මම නැවත නැගිටීම ගැන කියවමින් සිටියදී, තරුණ මනුෂ්‍යාගේ මුහුනමත දිප්තියක් සහ ඔහුගේ දෙතොල්මත සිනාවකින් පිරිනි. මම මාගේ බැහැදැකීම නිමාකර, මෙම ප්‍රියවන්ත පවුලෙන් සමුගත්තෙමි.

භාර්යාව සහ දරුවන්ව මා නැවත දුටුයේ භූමදානයේදිය. මම එම රාත්‍රියේදී තරුණ මනුෂ්‍යයෙකු සත්‍ය අයදිනවිට, මෝර්මොන් පොතෙන්, ඔහුගේ ප්‍රශ්ණයට පිලිතුර ඇසුනු හැටි මම සිතුවෙමි.

මෝර්මොන්ගේ පොතෙන් වෙනත් අනර්ඝ පොරොන්දුවේ, සමාදානයේ, නිදහසේ සහ ආශිර්වාදමත් පොරොන්දුන් ඇතුලත්වන්නේ අපි "කවරෙක්ද යේසුස් ක්‍රිස්තුස්වහන්සේවූ, දේශයේ දෙවියන්වහන්සේට සේවය කරන්නේ නම් පමණි" (ඊතර් 2:12)

දෙවියන්වහන්සේගේ පණත් ආරක්ෂාකළ අයට "අවසානයක්-නොවන සතුටක්" ලැබේ. "මක්නිසාද බලන්න, ඔවුහු ආත්මික සහ ලෞකික සියලු දෙයෙහිම ආශිර්වාද ලබන්නෙහුය. මෙම පොරොන්දුව එහි පිටුවලින් ලැබේ." (මොසායා 2:41)

උන්වහන්සේගේ අනර්ඝ පුත්‍රවරුන් සහ දූවරුන් ගළවාගැනිමේ "දෙවියන්වහන්සේගේ හස්තයෙහි යම් ප්‍රාණයක් පසුතැවිල්ලට ගෙන ඒමට උපකරණයක් වීමට" කැමතිවූවන්ට, "තේරුම් ගතනොහැකි ප්‍රීතිවීම්" එහි පිටුවලින් පොරොන්දු වන්නේය. (ඇල්මා 28:8; 29:9)

අපගේ මහා ලෝක ව්‍යාප්තික ධර්මදූත ක්‍රියාදාමයේ උත්සාහය තුලින්—විසිර සිටින ඊශ්‍රායෙලය එක්රැස් කරගන්නා බවත් එහි පිටුවලින් පොරොන්දු වන්නේය. (බලන්න 3 නෙපි 16; 21-22)

යේසුස් ක්‍රිස්තුස් වහන්සෙගේ ශුද්ධවූ නාමයෙන් පියාණන්වහන්සේට යාච්ඤා කරන විට අපගේ පවුල්වලට ආශිර්වාදය ලැබෙනබව එහි පිටුවලින් පොරොන්දු වන්නේය. (බලන්න 3 නෙපි 18:21).

"නුඹලගේ ජීවිතවලට සහ නුඹලාගේ ගෘහයන්ට ස්වාමින්වහන්සේගේ ආත්මයෙන් වැඩිවන්නාවූ ප්‍රමාණයක් පැමිණෙන්නේය, උන්වහන්සේගේ ආඥාවන්ට කීකරුව ගමන් කිරිමට ශක්තිමත්වූ අදිටනක් සහ දෙවියන්වහන්සේගේ පුත්‍රයාගේ ජීවමානත්වයේ ශක්තිමත් සාක්ෂියක සත්‍යය තහවුරුවිම එම පිටු අධ්‍යනය කිරිමෙන් අනාගතවක්තෘ පොරොන්දුවක් සම්පුර්ණවන්නේය."[1]

එනම් සැබෑ අරමුනකින්, ක්‍රිස්තුස්වහන්සේ තුල ඇදහිල්ල ඇතිව යාච්ඤා කරන්නේ නම් "ශුද්ධාත්මයන්ගේ බලය මගින් මෙම පොරොන්දුවල සත්‍යය අප දැනගන්නාබව මොර්මොන් පොතේ පිටු අතරින් මොරොනිගේ පොරොන්දුව පැමිනෙන්නේය." (බලන්න මොරොනි 10:4-5)

අනෙකුත් පසුදවස්වල අනාගතවක්තෘවරුන් සමග, මෙම සත්‍යයට මම සාක්ෂි දරමි "පොලොවේ වඩාත්ම නිවරදි පොත,"[2] මොර්මොන්ගේ පොතවන්නේය, එය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ තවත් ගිවිසුමකි. එහි පනිවිඩය පොලොව සිසාරා එහි පාඨකයන්ට සත්‍යයේ දැනගැනිමට පමුනුවන්නේය. මොර්මොන්ගේ පොත ජිවිත වෙනස් කරන බව මාගේ සාක්ෂියයි. අප සියල්ලෝම එය කියවා නැවත කියත්වා. තවද අප සියල්ලෝම අපගේ සාක්ෂි එහි ආනර්ඝ පොරොන්දුන් දෙවියන්වහන්සේගේ දරුවන් සියල්ලන් සමග සතුටින් බෙදාගනිත්වා.

**සටහන්**

1. ගොර්ඩන් බී හින්කලි. "A Testimony Vibrant and True," ලියහෝනා, අගෝ. 2005. 6.
2. *සභාවේ සභාපතිවරුන්ගේ ඉගැන්වීම්ඃ ජෝසප් ස්මිත්* (2007), 64.

---

## මෙම පනිවිඩයෙන් ඉගැන්වීම්

"මනුෂ්‍ය පවුල මුහුනදෙන සියළුම වියවුල් සහගත සහ සියළුම ප්‍රශ්ණන්ට සහ සියළුම ආකූලතාවයන්ට විසදුම් ලබාදෙන ප්‍රතිපප්තිමය සත්‍යයන්" ශුද්ධ ලියවිලිතුල අපට සොයාගත හැක (*Teaching, No Greater Call* [1999], 51). පවුල සමග ඔබ සභාපති මොන්සන්ගේ පණිවිඩය බෙදාගන්නා අතර, මොර්මොන්ගේ පොතේ ඔහු හදුනාගන්නා "ආනර්ඝ පොරොන්දුන්" ඇහුන්කන් දිමට ඔවුන්ට ආරාධනා කරන්න. ඔබට අර්ථදායක මොර්මොන්ගේ පොතේ පොරොන්දුන් ඔවුන් සමග බෙදාගත හැකිය.

© 2011 Intellectual Reserve, Inc. විසිනි. සියලු හිමිකම් ඇවිරිණි. ශ්‍රී ලංකාවේ මුද්‍රණයකරන ලදී. ඉංග්‍රීසි අනුමැතියඃ 6/10. පරිවර්තන අනුමැතියඃ 6/10. *First Presidency Message, October 2011.* Sinhala. 09770 408

ඇදහිල්ල • පවුල • සහනය

# අප අවිශ්වාස නොකරන්නේ නම්

*මෙම කොටස අධ්‍යනය කරන්න, සුදුසු ලෙස, ඔබ බැහැදැකින සහෝදරියන් සමග සාකච්ඡා කරන්න. ප්‍රශ්ණ ඔබගේ සහෝදරියන්ව ශක්තිමත් කිරීමට පාවිච්චි කරන්න තවද සහන සමිතිය ඔබගේ ස්වකිය ජිවිතයේ ක්‍රියාදාමයික කොටසක් කරගන්න*

මෝර්මොන්ගේ පොතෙහි අප ආදර්ශමත් තරුණ මනුෂ්‍යයන් බෙහෙවින් නිර්භීත, ධෛර්යමත්, සහ ශක්තිමත් ගැන කියවන්නෙමු. "එසේය ඔවුහු සත්‍යය සහ සිහිබුද්ධිය ඇති මනුෂ්‍යයන් වූහ, මක්නිසාද ඔවුන්ට දෙවියන්වහන්සේගේ ආඥාවන් පැවැත්වීමටත් උන්වහන්සේ ඉදිරියේ සෘජුව ගමන් කිරීමට උගන්වා තිබිනි" (ඇල්මා 53:21) මෙම ඇදහිලිවන්ත තරුණ මනුෂ්‍යයන් ඔවුන්ගේ මවුවරුන්ට ප්‍රසංසාව පුදකලේ—ඔවුන්ගේ ආදර්ශය සහ ගුරුවරුන්ටය.

හිලමන්ගේ රණශූරයන් මවුවරුන් ජිවත්වූ කාළය අපගේ කාලයමෙන් නොවේ. ඔවුන්ගේ කාළය අපහසු සහ අනතුරුදායකවිය, තවද තරුණයන් ශාරිරික සහ ආත්මීක නිදහස ආරක්ෂා කිරිමට කැඳවනු ලැබිය. අද අප ජිවත්වන "ලෝකයේ අපගේ පොර බැදිම මාංශයෙන් සහ රුධිරයට විරුද්ධව නොව අධිපතිකම්වලටත් පරාක්‍රමධාරීන්ටත් මේ අන්ධකාර ලෝක මූලාදෑනීන්ටත් ස්වර්ගීය ස්ථානවල සිටින දුෂ්ටකමේ ආත්ම සේනාවන්ටත් විරුද්ධවය" (එපිස 6:12).

අභියොගාත්මක කාලයන් ශක්තිමත් සහ ආදර්ශමත් දෙමාපියන් හිලමන්ගේ රණශූරයන් දන්නා සත්‍යය ඉගැන්වීමට ඉල්ලයි "ඔවුන් සැක නොකලහොත් දෙවියන්වහන්සේ ඔවුන්ව මුදවන සේක" (ඇල්මා 56:47). මෙම සත්‍යයන් අද ඉගැන්වීමට සහ ආදර්ශමත්ව සෙවිල්ලෙන් සිටිය යුතුවේ. කෙසේවුවත්, අප බියයුතු නොවේ. අප කවුරුන්දැයි සහ දෙවියන්වහන්සේ කවුදැයිද අපදන්නා විට උන්වහන්සේ සමග ගිවිසුම් තබා තිබෙන විට, අප- මෙම රණශූරයන්ගේ මවුවරුන්මෙන්- යහපත උදේසා මහත් පෙළඹවීමක් වන්නේය.

බොහෝවිට, හිලමන්ගේ (එක් එක්) රණශූරයන් 2060 දෙනා පොළෙඔවඅවට්නු ලබුයේ මව්වරුන්විමට පුළුවන. නමුත් මෙම මවුවරු තනිව කටයුතු නොකළහ. අනෙකුත් ධර්මිෂ්ඨ මනුෂ්‍යයන් සහ ගැහැනුන් සමග, මෙම මවුවරුන් ඔවුන්ගේ ඇදහිල්ල සහ ආදර්ශය අනෙකුන් සමග එකතුව ගිවිසුම් බලය උගන්වන්නට ඇත. එම දවසේ තරුන ජනතාව ඔවුන්ගේ දෙමාපියන් යුධනොකිරිමට කල ගිවිසුම තේරුම්ගත්හ. තවද එය ඉතා අපහසුවූ නමුත්, මෙම දෙමාපියයන්ට ඔවුන් කල ගිවිසුම- ඔවුන්ගේ නිදහස පැවැත්විමට ප්‍රේමණිය ස්වර්ගීය පියාණන්වහන්සේ ඔවුන්ට මාර්ගයක් විවෘත කරදුන්සේක (බලන්න ඇල්මා 56:5-9). අප ඒලෙසම අපගේ ගිවිසුම් ගරුකල යුතුය, එසේවුවිට දරුවන් සහ තරුණයන්- අපගේ ස්වකීය දරුවන් සහ අපගේ කොට්ඨාශවල, ශාඛාවල, අසල්වැසියන් සහ ජනතාවන්- තේරුම්ගෙන සහ ගිවිසුම් පැවැත්විමට සහයෝගය දක්වනු ඇත.

අපි අපගේ ගිවිසුම් රකිනවිට, ස්වර්ගීය පියාණන්වහන්සේට අප උදේසා මාර්ගයක් පිලියෙල කලහැක්කේය. අපට අපගේ ගිවිසුම් රැකියයුත්තේ නිශ්චිතවය, උදාහරනයක් ලෙස අපට, යාච්ඥාකල හැකිය, ශුද්ධ ලියවිලි අධ්‍යනය කල හැකිය, සුදුසු දේවමාලිගා නිර්දේශය රදවාගැනිමෙන්ද, සුදුසු ලෙස ඇඳුම් ඇඳීමෙන්ද, සබත් දවසට ගරුකිරිමෙන්ද නිශ්චිත විය හැකිය. අප එසේ කරනවිට, අපගේ දරුවන් දැන මෙසේ කියනු ඇත, "අපි සැක නොකරන්නෙමු, අපගේ මවුවරු එය දැනසිටියහ" (ඇල්මා 56:48).

ඔවුන්ගේ ශක්තිය පැමිණෙන්නේ ස්වාමින්වහන්සේගේ වන්දිගෙවිමෙන් බව තේරුම්ගන්නාවූ පසුදවස්වල ශුද්ධවන්ත කාන්තාවෝ අපහසු සහ අධෛර්යමත් කාලයන්හිදි අත්නොහරිති. ගිවිසුම් තබන්නන් ලෙස, අපි විශිෂ්ඨ ලෙස දිරිගන්විමෙන්, පෝෂණය කිරිමෙන් දරුවන් සහ තරුණයන් ආරක්ෂා කිරිමෙන් එනම් එක් දවසක මෙම නැගිඑන පරම්පරාවට, "ඉතා බලවත්වූ ධෛර්‍යයක් මම කිසිදා නොදැක්කෙමි, සියල්ලන් අතරෙහි නොමැත්තෙහිය" (ඇල්මා 56:45) අපට කිව හැකිවන්නේය.

*ශුද්ධ ලියවිලි තුලින්*

ඇල්මා 53; 56-58

### *මට කළහැක්කේ කුමක්ද?*

1. නැගඑන්නාවූ පරම්පරාව පොළබවීමට ඔවුන්ට තිබෙන බලය තේරුම්ගෙන පාවිච්චි කිරීමට මාගේ සහෝදරියට උපකාරිවීමට මට කළහැක්කේ කුමක්ද?

2. මම අද දිනයේ මුහුනදෙන අභියෝගයන්ට මොර්මොන්ගේ පොතෙන් පිලිතිරු සොයාගැනීමට මට ලැබෙන දිව්‍යමය මගපෙන්වීම කුමක්ද?

වැඩිදුර තොරතුරු ලබාගැනීමට, www.reliefsociety.lds.org වෙත යන්න.

© 2011 Intellectual Reserve, Inc. විසිනි. සියලු හිමිකම් ඇවිරිණි. ශ්‍රී ලංකාවේ මුද්‍රණයකරන ලදී. ඉංග්‍රීසි අනුමැතියː 6/10. පරිවර්තන අනුමැතියː 6/10. පරිවර්තනය *Visiting Teaching Message, October 2011.* 09970 408